1 වෙනි පිටුවෙන්.....

දෙවෙනි විජයග්‍රහණය

ඔබාමාගේ ඇමරිකන් ජනපතිවරණයෙන් උපුටා ගත්තකි. පොන්සේකා පිළ එම පාඨයම සිය ව්‍යාපාරයට මුලට දාගත්තද සිය සගයා බලයට ආවේ නම් ඒ තුළින් මෙම ප්‍රතිගාමීන් හැත්ත බලාපොරොත්තු වූයේ රට ආපස්සට හැරවීම අවුල්කිරීම සහ විනාසකිරීම ය.

ජන්දයකට යෑමට ගත් තීරණය

රටේ වර්තමාන තත්වය තුළ ජනතාව අතර තම දේශපාලන ස්ථාවරය ශක්තිමත්ව ගොඩනගා ගැන්මේ අවශ්‍යතාව මහින්ද රාජපක්ෂ ජනාධිපති වරයාට ඇතිවන්නට ඇත. ඔහු **2005** ජනපති වරණය දිනුවේ විශාල වැඩි ඡන්ද ප්‍රමාණයකින් නොවේ. රාජපක්ෂ මහතාට **51%** ක් ද, රනිල් වික්‍රමසිංහ මහතාට **49%** ද ලැබිණ. එය ඉතා පටු ප්‍රමාණයකි. එකල පාර්ලිමේන්තුවේ තත්වයද එතරම් සතුටුදායක නොවන අන්දමේ රජයට තිබුණේ වැඩි ආසන දෙකක් පමණි. අවසාන අවුරුදු හතර ජනාධිපතිවරයාට පසුකරන්නට සිදුවූයේ සර්කස් එකක ගුවනේ කඹය දිගේ ගමන්කරන කරනම්කාරයෙකු පරිද්දෙන් ඉතා සීරුවෙන් පරිස්සම්නි. සිය තත්වය යම් සතුටුදායක තත්වයකට ගෙන එන්නට ඔහුට යම් යම් ක්‍රමවේද උපයෝගී කරගන්නට සිදුවිය. ජනතාව නුරුස්සන ඇතැම් පුද්ගලයන්ද, අවස්ථාවාදීන්ද, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ද බාගන්නට ඔහුට සිදුවිය. මේ සියල්ල අතරේ යුද්ධය ද දිගටම ගියේය. කොතරම් බාධක තිබුණද එය අතහරින්නට බැරිය. ඒ අතරේ විවිධ රටවල ඇහිලි ගැසීම්වලට ප්‍රතිචාර දක්වන්නටත් රජයට සිදුවිය. එදා යම් හෙයකින් රාජපක්ෂ රජය වැටුණි නම් ශ්‍රීලංකාව නැත්තටම නැතිවන තත්වයකට පත්වෙනු නොඅනුමානය. එසේ නම් නිසැකවම තවම ප්‍රභාකරන්ද, කොටි නායක යන් සියළු දෙනාම ද, එල්ටීටීඊය ද නිරූපදිත ය. එසේ නම් ඊළම් රාජ්‍යයකට මේ වන විට අඩිතාලම වැටී අවසාන ය.

මෙම ලබන අප්‍රියෙල් මාසය තුළ පාර්ලිමේන්තු මැතිවරණයද පවත්වන්නට නියමිත ය. එබැවින් ජනාධිපතිවරයා සිතන්නට ඇත්තේ ප්‍රථමයෙන් ජනපතිවරණය පවත්වා වැඩි ඡන්ද ප්‍රමාණයකින් සිය බලය මනාව තහවුරු කරගන්නට හැකිවුවහොත් ඊළඟ මහමැතිවරණයේදී තමා යටතේ ඇති එක්සත් ජනතා නිදහස් සන්ධානයට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් හිමිවනු ඇති බවයි. එක අතකට එය සුදුවකට යාමක් වැනිය. එහෙත් එය මනාව සැළසුම් කළ සුදුවකි. මක්නිසාද ජනාධිපති වරයා සාමාන්‍ය ජනතාවට වඩාත් සමීපව සිටින නිසා ඔවුන්ගේ හෘද ස්පන්දනය කෙබඳුදැයි නියමාකාරයෙන් වටහාගෙන සිටීමයි. සැබැවින්ම සිතූපරිදි එය සාර්ථක විය.

ප්‍රතිගාමී සතුරු බලවේග යුහුසුලුව වැඩ පටන්ගනී

ඡන්දයක් ළඟ එන බව ප්‍රකාශකරත්ම ප්‍රතිගාමීහු යුහුසුළුව වැඩට බැස සිටිති. ඔව්හු දැන් ජනතාව අතර බොරු අසත්‍ය සිදුවීම් ගැන ප්‍රචාර කටින් කට පතුරුවති. ජංගම දුරකථනවලට එස් එම් එස් පණිවුඩ යවති. කාර්යාල තුළද කතා බහ කරති. ත්‍රීරෝද රියැදුරන්ට මුදල් ගෙවා උපදෙස් දී ඇත්තේ වාහනයේ යන අයට එම බොරු ප්‍රවෘත්ති පවසන ලෙසත්, වැඩකරන ජනතාව දැන් රජයෙන් ඉවතට යමින් සිටින බව ඇඟවීම ටත්ය. ජනපතිවරණයේදී ද ජෙනරාල්ට තමන් ඇතුළු වැඩකරන ජනතාව දූෂණයෙන් තොර ශ්‍රීලංකාවක් සඳහා ඡන්දය දෙන බව ත්‍රීවිලර් කරුවන් තම රථයේ ගමන්ගන්නා අයට කියා ඇත්තේ සමහර රැවටෙන අහිංසක ජනතාව නොමග යැවීම පිණිස ය.

මෙම කටකතාවල ප්‍රධාන කාරණය වශයෙන් ගෙනඇත්තේ රජයේ සියළුම මැති ඇමතිවරුද, ජනාධිපතිවරයාද, ඔහුගේ පවුලේ අයද (ඔවුන් නම්කර ඇති අන්දමට රාජපක්ෂ සහෝදර සමාගම) මහා පරිමාණයෙන් රටේ ඉඩම්, වතු හා දේපළ මිලදීගන්නා බවත්, බොහෝ කොම්පැනි, සමාගම්, සංස්ථා ආදියෙහි කොටස් මේ පිරිස මිලදීගෙන ඇති බවත්, කොමිස් හා අල්ලස් මිලියන ගණනින් ගෙන ඇති බවත්, රටේ ධනය සූරා කා රට අගාධයට හෙළා ඇති බවත්ය. එසේම ජනාධිපතිවරයා ඥාති සංග්‍රහය අකුරටම කරමින් රටේ තනතුරු සිය පවුලේ අයට බෙදා දී ඇති බවටත් ඔව්හු දිගටම චෝදනා කරති.

දැනට ලංකාව පුරා සිදුවන ඉදිකිරීම්, අළුත් වැඩියාකිරීම් විශේෂයෙන් යුද්ධයෙන් විනාශවී ගිය, මුදාගත් උතුරුකරයේ සංවර්ධන කටයුතු (උතුරු වසන්තය) ඇරඹීමෙන් පසු ප්‍රතිගාමීන්ට ඉහතකී බොරු ප්‍රචාරයන් පතුරුවන්නට ලේසි තත්වයක් ඇතිවිය. මෙම අසත්‍ය කතා ගොතන්නට පහසුවූ අතර ඒවා නාගරික මැද පන්තියේ අනුවණ ජන කොටස්වලට සාකච්ඡාවට සුදුසු මිහිරි ප්‍රවාත්ති වීය. එසේම ඒවා සීඝ්‍රයෙන් පතුරුවා හැරිය හැකිවීය. ඕනෑම කටකතාවක් නොවිමසා කියූ සැටියෙන් පිළිගැනීමට නම්‍යතාවක්, හුරුවක් අපේ රටේ තිබේ. එබැවින් ප්‍රතිගාමීහු මෙම හිට්ලර් යුගයේ ගොබෙල්සියන් උපක්‍රමය රජයේ නායකයන්ට එරෙහිව යොදා ගත්හ. (ගොබෙල්ස් යනු හිට්ලර්ගේ යුද ප්‍රචාරක නිලධාරියා වීය. ඔහුගේ මතය වූයේ ඕනෑම බොරුවක් ගොතා එය දිගටම පුන පුනා කිව-හොත් ජනතාව ඒ බොරු විශ්වාස කරන බවය.) රාජපක්ෂ සොහොයුරන් තමන්ට පැවරූ ඕනෑම කාර්‍යයක් මනාව ඉටුකරන්නට දක්ෂතා ඇති අය පමණක් නොව, ඔවුන් ඒ පැවරූ කාර්‍යයන් ක්‍රියාවට නගා ප්‍රථිපල සහිතව ඔප්පුකර ඇති බවද බොහෝ අයට අමතක විය. ගොබෙල්-සියන් ක්‍රමය යොදාගනිමින් ප්‍රතිගාමීහු පරිගණක, විද්‍යුත් තැපැල, වෙබ් අඩවි, මුද්‍රිත මාධ්‍යය, ජංගම දුරකතන හරහා එස්. එම්. එස්. පණිවුඩ යැවීම ආදියෙන් කටකතා දිගටම පැතිරූහ. නාගරික, ඉංග්‍රීසි කතාකරන මධ්‍යම පන්තියට ප්‍රියසාද, අවන්හල්, බීමශාලා ආදියේ කාලය ගෙවන්නට මෙම බොරු ප්‍රවෘත්ති හොඳ අංගයක් වීය. කෙනෙක් අනිකාට තමා ඇසූ පුවත කියන්නේ තවත් යමක් අතිනුත් දමාය. කිසිවෙක් ඒ අසන පුවත්වල සත්‍යතාව හෝ, වියහැකිද යන්න හෝ නෙසෙවූහ. එක් පුවතක වූයේ ගොඨාභය හා බැසිල් රාජපක්ෂ සොහොයුරන් දෙදෙන කොළඹ ඇපලෝ රෝහල හා ගොල්ෆ් පිටිය මුදල් දී මිළටගෙන ඇති බවයි. බොහෝ අය එය තවම විස්වාස කරති.

ජනපතිවරණ නාමයෝජනා

2009 දෙසැම්බර් 18 වන දින ජනපතිවරණය සඳහා නාමයෝජනා බාරගැනීම රජය විසින් අරඹන ලද අතර 2010 ජනවාරි 26 වන දින ජනපතිවරණය පැවැත්වෙන දිනය ලෙස දන්වන ලදී. දැනට බලයේ සිටින විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ පැහැදිලි ලෙස එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් තරඟකරන අපේක්ෂකයා වූ අතර, හරි තරඟකරුවෙකු සොයගන්නට අපහසු වී විපක්ෂය ඒ මේ අත ඇඹරෙන්නට වීය. විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ තරඟයට ඉදිරිපත් නොවුනේ තමා ජනතාව අතර ජනප්‍රිය නැති බවත්, යම් හෙයකින් ආවා නම් විශාල පරාජයක් ලබන බවත් කල්තියාම දැන සිටි නිසාය. ජනතා විමුක්ති පෙරමුණ ද පළාත් පාලන මැතිවරණයෙන් ලද පරාජය මත පක්ෂය තුළ අවුල් සහගත තත්වයකට මුහුණ දුන් අතර, අනෙක් පාවෙන මංමුලාවූ තත්වයක සිටි, සහ තවමත් සිටින මංගල සමරවීර, රවුප් හකීම් සහ මනෝ ගනේෂන් ආදී අයද වටපිට බලන්නට වූහ. ප්‍රතිපත්ති වශයෙන් එකිනෙකට පරස්පර විරෝධී වුවද ඔවුන් ආයාසයෙන් කෙසේ හෝ සුන්බුන් එකතුකර එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (United Democratic Front) නමින් පෙරමුණක් සාදාගෙන ජෙනරාල් පොන්සේකා වටා තොණ්ඩුවක් දාගන්නට සමත් වුණේ ඔහු රාජපක්ෂවරුන් සමග හිත නොහොඳින් ඉන්නා බව දත් නිසාය. අවසානයේ ජෙනරාල් පොන්සේකා පොදු අපේක්ෂකයා ලෙස ඔව්හු ඉදිරියට ගෙන ආහ. ඒ කාහටත් ඇති එකම පොදු තත්වය නම් ඔවුන් තුළ වර්තමාන ජනාධිපතිවරයා සමග ඇති තරහ හා වෛරය පමණි.

අනේ පුතේ..... ඔහේට ඇර වෙන කාට දෙන්නද අපේ ජන්දෙ ?

පොදු අපේක්ෂකයාට තමාගේම යයි පක්ෂයක් නැත. ඒ ඔහු ඉන් පෙර කිසිදු දේශපාලනයක නොසිටි නිසාය. එබැවින් ඔහුට ඡන්ද ලකුණක් කාගෙන් හෝ ණයට ගන්නට සිදුවිය. කලින් දේශපාලන පක්ෂයක කෙනෙක් ලියාපදිංචි කර තිබූ හංසයා ලකුණ විපක්ෂය තෝරා දුන්නාය.

ජන්ද ව්‍යාපාරය දියත්විය

මුලදීම ඡන්ද කොමසාරිස්වරයා ඡන්ද නීති පහදා දී ඒවා ගරුකළයුතු බව සියළු අපේක්ෂකයන්ට මතක් කර දෙන ලදී. අනතුරුව ඔහු පොලිස්පති වරයා ඇතුළු පොලීසියෙන් ඉල්ලා සිටියේ ඒ නිති රීති ක්‍රියාත්මක කරන ලෙසයි.

1. ලංකාව පුරාම පාරක් හංදියක් ගානේ ඉදිකර ඇති දැවැන්ත කටවුට්, බැනර්, පෝස්ටර් සියල්ල ගලවා දමන ලෙස අණ කිරීම. ඒවා නොගැලවුවහොත් පොලීසිය විසින් බලෙන් ගැලවීම. සැබැවින්ම ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනාම මේ කරුණ ගැන වැරදිකරුවෝය. අපේක්ෂකයින්ගේ ඡන්ද කාර්‍යාල අසල ගසා ඇති පෝස්ටර් බැනර් හැර අන් සියළු තන්හි තිබුණු ඒවා පොලීසිය ගැලවූයේය.

2. මාධ්‍යය විශේෂයෙන් ටෙලිවිෂන් සහ පුවත් පත් රැස්වීම් හා රැළි ගැන වාර්තාකරණයේදී සමාන ලෙස ඒවා විකාශ නය කරන ලෙස උපදෙස් දෙනලදී. මුලදී නැතත්, පසුව මේ වාර්තාකරණය නියම පිළිවෙළට වැටිණ. එහෙත් විපක්ෂය චෝදනා කළේ රාජ්‍ය මාධ්‍ය ආයතන ඒක පාක්ෂිකව කටයුතු කළ බවයි.

සරත් පොන්සේකා මහතාගේ රැස්වීම් වලට විශාල ජනකායක් මුල් අවධියේ ඇදී ආවේය. ඒ නිසාම ඔහු ජයග්‍රහණය කරන්නට යන බව ඇතැම් අය කීහ. සැබැවින්ම ඒ ආ බොහෝ දෙනාට අවශ්‍ය වූයේ මේ අළුත් අපේක්ෂකයා දකින්නට හා ඔහු කියන්නේ කුමක්දැයි අසා ගන්නටය. ප්‍රථම සති දෙකේ මෙසේ වූ නමුත් පසුව කෙමෙන් රාජපක්ෂ කඳවුර වටා ජනයා රොක්වන්නට වූහ. අවසන් දවස් වනවිට ජනතාව බහුතරයක් සැබැවින්ම එයට පක්ෂපාතී විය.

අපේක්ෂක ප්‍රතිපත්ති ප්‍රකාශන

සරත් පොන්සේකා මහතාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කෙටි කරුණු **10** කින් පමණක් සමන්විත වූ අතර ඒවා දීර්ඝ වශයෙන් විස්තර කර නොතිබිණ. දේශපාලනයට නවකයෙකු නිසා ඔහුට ප්‍රතිපත්ති වශයෙන් කියන්නට යමක් නැතුවා වැනිය. සියළු ප්‍රකාශන අවසන් වුණේ " මම කරනවා" යනුවෙනි. සැබැවින්ම එය හතරේ පන්තියේ ළමයෙකු ලියන " මා අගමැති වුවොත් ....." හෝ " මා ලක්ෂ පතියෙකු වුවොත්....." ආදී වාක්‍ය රචනාවක් වැනිය. පොන්සේකා ප්‍රතිපත්ති ප්‍රකාශනය ගැන සිතද්දී ඉස්සර ඉරිදා ලංකාදීප පත්‍රයේ පළවූ හාස්‍ය ජනක " පොඩි එකාගේ ලියුම" මෙහිදී අපගේ සිහියට නැගේ.

රාජපක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනය හඳුන්වා තිබුණේ **මහින්ද චින්තනය ඉදිරි දැක්ම** යනුවෙනි. එය **2005** දී ප්‍රකාශයට පත් කළ **මහින්ද චින්තනය** තවත් ඉදිරියට ගෙනයෑමකි. එය විස්තරාත්මක ලෙසින් සංවර්ධනයේ සියළු අංශ සහ ඉදිරියට කෙරීමට නියමිත කාර්‍යයන් ගැන හොඳින් කරුණු අඩංගු කළ පිටු 31 ක සටහනකි. මෙම ප්‍රකාශනය කියවූ කෙනෙකුට වර්තමාන රජයේ සැබෑ ඉදිරි වැඩ පිළිවෙල අවබෝධ වන්නේය. එබැවින් මූලිකවම එය සුබවාදීව ජනතාවට දිස්වුණ අතර පොන්සේකා ප්‍රකාශනය තුළ එතරම් ගතයුතු දෙයක් නැති බවද ජනතාවට වැටහිණ. එසේම එම කඳවුරේ සෑම අයගෙන්ම රජයට මැසිවිලි අවලාද නැගුණා මිස, රජයට මඩ විසි කළා මිස රටේ ඉදිරි ගමනට ගන්නා ක්‍රියා මාර්ග හෝ මතුව ඇති ප්‍රශ්න වලට පිළියම් හෝ කිසිවක් ප්‍රකාශ නූනේය.

එසේම පොන්සේකා කඳවුරෙන් ප්‍රකාශයට පත් කළ සෑම රජයේ සේවකයෙකුටම රුපියල් **10,000** ක් පඩි වැඩිකරනවාය යන පොරොන්දුව එතරම් ජනතා විශ්වාසය දිනුවේ නැත. ඒ කරුණ රාජපක්ෂ කඳවුරේ අය පුවත් පත්වලින් හා ටෙලිවිෂන් සාකච්ඡාවලදී විග්‍රහකර පෙන්වා දුන්නේ එම පොරොන්දු මුදල සැබෑ වශයෙන් කොහෙත්ම කළ නොහැකි දෙයක් බවයි.

ජෙනරාල් පොන්සේකා මුහුණ පෑ ලොකුම ඇබැද්දිය නම් ඔහුගේ බෑණා සම්බන්ධ වූයේ යයි කියන ආයුධ ගනුදෙනුවේ විස්තර හා එය පොන්සේකාත් දැනුවත්ව සිදුවූ බව ඔහුගේ යුද හමුදා සගයෙකු විසින් ප්‍රකාශයට පත් කළ අවස්ථාවේ ජෙනරාල් ප්‍රසිද්ධියේම එම හමුදා සගයාට **කලවැද්දා, පාහරයා** ආදී වශයෙන් පරිභවකිරීම ඔහු කෙරෙන් ජනතාව ඈත්වන්නට වූ එක් කරුණකි. මෙවැනි කෙනෙක්ද ජනාධිපති වෙන්න යන්නේ? මිනිස්සු අසන්නට වූහ.

මේ අතරේ කොටි හිතවාදී දෙමළ ජාතික සන්ධානයේ ආර්. සම්බන්ධන් මන්ත්‍රීවරයා සරත් පොන්සේකාට සහාය දෙන්නට ඉදිරිපත් විය. ඔහු කීවේ ඔහු ඉල්ලීම් මාලාවක් මහින්ද රාජපක්ෂට ඉදිරිපත් කළ බවත්, ඔහු ඒවා ප්‍රතික්ෂේප කළ බවත්, එහෙත් පොන්සේකා එය පිළිගත් බවත්, ඒනිසා තමාගේ සහ දෙමළ ජනයාගේ සහාය ඔහුට දෙන බවත්ය. උතුර හා නැගණහිර යළි එකට ඇදීම, උතුරෙන් හමුදා කඳවුරු ඉවත්කිරීම හා දැනට අත්අඩංගුවේ සිටින කොටි ත්‍රස්තවාදීන් නිදහස් කිරීම ආදී කරුණු රැසකට පොන්සේකා එකඟ වූ බවද සම්බන්ධන් කීවේ ය.

මේ දේවල් හෙළිවීම සැබැවින්ම සරත් පොන්සේකා කෙරෙහි ජනතාව විශේෂයෙන් සිංහළ දේශප්‍රේමීන්ගේ කළකිරීම වැඩිකරවන්නක් විය. එසේම රාජ්‍ය මාධ්‍යයෙන් මෙය හඳුන්වා දුන්නේ **මහා පාවාදීම** යන ශීර්ෂයෙනි.

ජන්ද ප්‍රථිඵල

ජනවාරි 26 වන දින රාත්‍රි 1130 සිට තැපැල් ඡන්ද ප්‍රථිපල මුලින් නිකුත් විය. එය 70% ක් රාජපක්ෂ මහතාටද 30% පොන්සේකා මහතාටද වැටී තිබුණි. රජයේ සේවකයන් රුපියල් 10,000 දීමනාවේ ඇමට අසුවී නැති බව ඉන් පෙනිණ. පසුදාට එළිවන විට ප්‍රථිඵල බොහොමයක් ආවේ ජනාධිපතිවරයාගේ පැත්තටය. උතුරු නැගණහිර දෙමළ ඡන්ද බහුතරය ලැබුණේ පොන්සේකා වය. කොළඹ නගරය ද ඔහුටය. එහෙත් කොළඹ දිස්ත්‍රික්කයේ දිනුම මහින්ද රාජපක්ෂටය.

අවසානයේ සමස්ථ ජනපතිවරණයේ ප්‍රථිඵල වලින් **58 %** ක් මහින්ද රාජපක්ෂ මහතාටද **40 %** ජෙනරාල්ටද හිමිවිය. මේ ප්‍රථිපල දෙස බලන කල වැටහෙන කරුණ නම් දේශප්‍රේමී ජනතාව බහුතරයක් අප රටේ වෙසෙන වගයි. රට විනාශ මුඛයට වැටෙන්න ගිය මේ දෙවන වර ද ඔව්හු යළි රට බේරාගත්හ. ඒ ශක්තිය, ප්‍රඥාව හා දේශප්‍රේමය ඔවුන් තුළ හැමදා පවතීවා!

♦ **සංජය විමලරත්න**